# නෛතික හා සංස්කෘතික තහනම්

පසුගිය හතරවැනිදා "දිවයින ඉරිදා සංග්‍රහයෙහි" අශෝක හඳගම සමග පැවැත්වූ බව පෙනෙන සම්මුඛ සාකච්ඡාවක් පළවී තිබිණි. ඒ සාකච්ඡාවෙහි දී හඳගම නොයෙකුත් දේ සඳහන් කරයි. ඒ සියල්ලටම පිළිතුරු දියහැකිවා පමණක් නොව එමගින් ඔහු ජාතක කතා, මව් සෙනෙහස ආදිය ගැන කතාකළ ද කෙතරම් දුරට මෙරට සංස්කෘතිය නොහඳුනන්නකු යන්න ද පැහැදිලි කළ හැකිය. එහෙත් ඒ පිළිතුරු දීමට මේ අවස්ථාව නොවෙයි. මම මෙහිදී ඔහු විසින් මා සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයට පමණක් අවධානය යොමු කරමි. ඔහු මෙසේ කියා ඇත. "නලින් ද සිල්වා ගුවන් විදුලි සාකච්ඡාවක කියනවා ඩා වින්චි කෝඩ් ලංකාවේ තහනම් කිරීම හින්දි රැඟුම් පාලක මණ්ඩලය ඉල්ලා අස්වෙන්න ඕන කියලා. මොකද රැඟුම්පාලක මණ්ඩලයෙන් අහන්නේ නැතිවයි ඒ කටයුත්ත කරන්නෙ. එහෙම කියන නලින් ම අකෂරය පෙන්වීම තහනම් නොකිරීම ගැන රැඟුම්පාලක මණ්ඩලයට දොස් කියනවා බටහිර ගැත්තො කියලා. මේ දෙකොනින් කරන කතා. මේ කතා තුළ පිළිබිඹුවන්නේ නිරුවත් වර්ගවාදයයි. අපට අනුව එයයි අශිෂ්ට. කලා කෘතියක එන දර්ශනයක් නෙමෙයි අශෝක හඳගම කතාකරන්නේ එක කොණකින් බව පැහැදිලිය. ඒ කිනම් කොනදැයි යන්න ද ඒ තරමට ම පැහැදිලි ය.

මා ගුවන් විදුලි සාකච්ඡාවේදී කීවේ තමන් ද නොබැලූ චිත්‍රපටියක් තමන්ගෙන් විමසීමකුදු නොකර තහනම් කිරීම පිළිබඳව විලි ලැ-ජාවක් ඇති රැඟුම්පාලක මණ්ඩලයක් නම් ඉල්ලා අස්විය යුතු බවය. සාකච්ඡාවේදී ඒ වචන ඒ ආකාරයෙන්ම සඳහන් නොවන්නට ඇතත් එහි මූලික අදහස වූයේ එයයි. ඉන් කියැවෙන්නේ රැඟුම්පාලක මණ්ඩලය අනිවාර්යයෙන්ම ඉල්ලා අස්විය යුතු බව නොව ල-ජාවක් ඇත්නම් අස්විය යුතු බවය. එහෙත් මම කිසි දිනෙක කොතැනකවත් අකෂරය තහනම් නොකිරීම පිළිබඳව රැඟුම්පාලක මණ්ඩලයට දොස් නොකීවෙමි. ඒ තබා ඩා වින්චි කෝඩ් හෝ අකෂරය හෝ තහනම් කළ යුතු බවක් හෝ නොකළ යුතු බවක් හෝ නො කීවෙමි. අකෂරය පිළිබඳ අධිකරණය ඉදිරියේ නඩුවක් ඇත. අධිකරණය දෙන තීන්දුව කුමක් දැයි දැනගැනීමට මම ඉවසිලිමත් ව බලා සිටිමි. මගේ කතාව තුළ පිළිබිඹු වන්නේ වර්ගවාදය යැයි හඳගම කියයි. ඔහු එසේ කියන්නේ කිනම් න්‍යායකට (ලොජික්) අනුව ද? කිනම් පදනමකින් ද? මා කියා ඇති දෙයෙහි අශිෂ්ට බව කුමක්ද? වර්ගවාදීහු, වර්ගෝත්තමවාදීහු කවරහු ද?

පසුගිය සතියෙහි මේ තීරුවෙන් ඩා වින්චි කෝඩ් චිත්‍රපටය ගැන කතා කෙළෙමි. එහි පවා ඩා වින්චි කෝඩ් හෝ අකෂරය හෝ තහනම් කිරීම හොඳද නැද්ද යන්න සඳහන් කර නැත. තාකෂණය හේතුකොටගෙන අද චිත්‍රපටයක් තහනම් කිරීම ඇතැම් පුද්ගලයන් සම්බන්ධයෙන් ප්‍රතිඵල ගෙන නොදෙයි. ඔවුන්ට ඒ චිත්‍රපටවල පිටපත් නැරඹිය හැකිය. එහෙත් ඔවුන් නරඹන්නේ චිත්‍රපටයක් නොවේ යැයි ද ලාබ පිටපතක් පමණක් යැයි ද කිසිවකුට කිව හැකිය. චිත්‍රපටයක් නම් පහසුකම් ඇති ශාලාවක ප්‍රදර්ශනය කළ යුත්තක් ය යන පදනමින් නම් කිවහැක්කේ චිත්‍රපටියක් තහනම් කිරීමෙන් ඉතා විශාල පිරිසකට ඒ චිත්‍රපටිය නැරඹීමට අවස්ථාවක් නොලැබෙන බවය. ඒ කෙසේ වෙතත් මෙරට රැඟුම්පාලක මණ්ඩලය චිත්‍රපටි හුදු වර්ගීකරණයකට ලක්කරන ආයතනයක් නොවේ. අවශ්‍ය පරිදි තහනම් කිරීමේ බලය ද රැඟුම්පාලක මණ්ඩලයට ඇත. ඉන් පැහැදිලිවන කරුණක් වෙයි. ඒ කලාකරුවාට අසීමිත නිදහසක් නැති බවය. බ්‍රිතානියේ හෝ වෙනත් බටහිර රටක කලාකරුවාට අසීමිත නිදහසක් ඇතැයි යමකුට කිව හැකිය. ඩා වින්චි කෝඩ් චිත්‍රපටයට බටහිර විරෝධයක් පැන නැගුණ ද ඒ තහනම් නො කෙරිණි. ආගමින් කතෝලික රටක් ලෙස සැලකිය හැකි ඉතාලියේ ද ඩා වින්චි කෝඩ් චිත්‍රපටය හෝ පොත හෝ තහනම් කෙරී නැත. එහෙත් බෞද්ධ යැයි කියැවෙන ලංකාවේ සිංහල බෞද්ධයන්ගේ බහුතර ඡන්දයෙන් පත්වූ ජනාධිපතිවරයෙක් කතෝලික පූජකවරුන්ගේ ඉල්ලීමකට කන්දෙමින් චිත්‍රපටය තහනම් කිරීමට පියවර ගත්තේය.

බටහිර ආගමින් කතෝලික රටවල පවා අද ඇත්තේ බටහිර නූතනත්ව (කතෝලික නොවන) ක්‍රිස්තියානි සංස්කෘතික (හා ආර්ථික හා දේශපාලනික) ආධිපත්‍යයකි. ආගමින් කතෝලික යැයි කියන රටවල පවා කතෝලික ආගමට එරෙහි ව චිත්‍රපට ප්‍රදර්ශනය කළ හැක්කේ එබැවිනි. එහෙත් ක්‍රිස්තියානි ආධිපත්‍යයට එරෙහි චිත්‍රපටයක් තවමත් බටහිර යුරෝපයෙහි හෝ උතුරු ඇමරිකාවෙහි හෝ ප්‍රදර්ශනය කිරීමට හැකි යැයි මම නො සිතමි. මාරි මග්දලේනාගේ කුසෙහි

© Prof. Nalin De Silva

ක්‍රිස්තුස්වහන්සේගේ දරුවකු සිටි බව කියැවෙන චිත්‍රපටයක් නිපදවුව ද ඩයනාගේ කුසෙහි මුස්ලිම් මිනිසකුගේ දරුවකු සිටි බව කියැවෙන චිත්‍රපටයක් නිපදවිය හැකිද චිත්‍රපට නිෂ්පාදකයන්ට චිත්‍රපට නිපදවීමට හැකි වී ඇත්තේ බටහිර විද්‍යාව හා තාකෂණය හේතුකොටගෙන ය. අද බටහිර විද්‍යාවේ විද්‍යාඥයන්ට තමන්ට කැමති ඕනෑම පරීකෂණයක් කිරීමට නිදහස නැත. මිනිස් ක්ලෝනිකරණය එවැන්නකි. හදවත් බද්ධ කිරීම් කළ හැකි වුවද මොළය බද්ධකිරීම් ගැන කතාවක් කළ නොහැකිය. ඒ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි පුද්ගලයා මොළය සමග යම් අනන්‍යතාවක් ඇතිකරගෙන ඇතැයි සිතන බැවින්ය. කෙනකුගේ හදවත, වකුගඩුව, ආදී අවයවයක් වෙනත් අයකුට බද්ධ කළ පමණින් දෙවැන්නා පළමුවැන්නා බවට පත්නොවේ. එසේම කෙනකුගේ ලේ තවත් අයකුට දුන් පමණින් ද එවැනි වෙනසක් ඇති නොවේ. එහෙත් මොළයක් බද්ධකළහොත් කුමක්වන්නේ ද? එසේ මොළයක් බද්ධකිරීම කළහැකි වුවත් නැතත් ඒ හේතුවෙන් කුමක් වන්නේ ද යන්න අද කල්පනා කෙරෙන්නේ බටහිර නූතනත්ව ක්‍රිස්තියානි සංස්කෘතික තහංචිවලට අනුවය.

තහංචි, තහනම් ආදිය වාස්තවික හෝ සදාකාලිකව පවත්නා දේ හෝ නොවෙයි. අනෙක් සෑම දෙයක්ම මෙන්ම තහංචි හා තහනම් ද සාපේකෂය ය. මා මෙහිදී කතාකරන්නේ අයින්ස්ටයිනීය සාපේජෂතාවක් අනුව නොව නිර්මාණාත්මක සාපේකෂතාවාදය අනුවය. අයින්ස්ටයිනීය සාපේකෂතාව එතරම් ගැඹුරු සාපේකෂතාවක් නොවේ. තහංචි තහනම් ආදිය ද මිනිසුන්ගේ නිර්මාණ වෙයි. මිනිසුන් ඒ තහනම් කරන්නේ යම් සංස්කෘතියක ය. සෑම සංස්කෘතියකටම පොදු වූ තහනම් ඇතැයි සිතන්නා අමුම අමු වර්ගෝත්තමවාදියෙකි. එලෙස පොදු තහනමක් ගැන කතාකරන්නා අද තම පොදු තහනම ඉදිරිපත් කරන්නේ බටහිර නූනනත්ව ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය. එසේ පොදු තහනමක් ගැන කතාකිරීමේදී බටහිර නූතනත්ව සංස්කෘතියෙහි තහනම් අනෙක් සංස්කෘතින් මත බලයෙන් පැටවීමක් සිදුවෙයි. එසේ කරන්නේ බටහිර නූතනත්ව සංස්කෘතිය එක්කෝ දියුණුය. නැත්නම් උසස් ය. වර්ධනය වී ඇත ආදී වශයෙන් අනෙක් සංස්කෘතීන් යටපත්කරගන්නා උපකල්පන පෙරදැරිකරගෙනය. මෙයට වඩා වර්ගෝත්තමවාදයක් ලෝකයේ තිබිය හැකි ද? බටහිර ක්‍රිස්තියානි නූතනත්ව සංස්කෘතිය ආශ්‍රිත වර්ගෝත්තමවාදයට වැඩි වර්ගෝත්තමවාදයක් ලෝකයේ කිසි දිනෙක තිබී නැත. අද ඒ වෙනුවෙන් මෙරට පෙනී සිටින අලෙවි නියෝජිතයෝ (සේල්ස් රෙප්ලා) වෙති.

තහනම්, තහංචි කිසිවක් නැති ලෝකයක් නැත. රටක නීතියෙන් කෙරෙන්නේ ම තහනම් පැනවීමකි. හඳගම ම කලකට පෙර මාඝාත නමින් නාට්‍යයක් නිෂ්පාදනය කළේය. ඒ එකල සිදු වූ මිනිස් ඝාතන අළලා විය. එහෙත් නාට්‍යය නිර්මාණය වී තිබුණේ ලංකාවේ පැරැණි සිංහල සමාජයෙහි එක් කලෙක තිබූ සත්ත්ව ඝාතන තහනම් කරන නීතියක් (මාඝාතය) පදනම් කරගනිමිනි. අද ලංකාවේ සත්ත්ව ඝාතන තහනම් නියෝගයක් පැනවුවහොත් ඊනියා ප්‍රබුද්ධයන් තමන්ට මස් කැල්ලක් කෑමට ඇති අයිතියක් වෙනුවෙන් සටන් වදිනු ඇත. ඒ සඳහා ඩොලර් ෆ්‍රෑන්ක් පවුම් ආදිය ද ලැබෙනු ඇත. ඊනියා ප්‍රබුද්ධ සිනමා හා නාට්‍ය නිෂ්පාදකයකු වෙසක් කාලයේ දී මස් කැල්ලක් කෑමට නැති වී යැයි අඳෝනා කීවේ ලු. ඔහු එසේ කරන්නේ බටහිර නූතනත්ව ක්‍රිස්තියානි සංස්කෘතියෙහි පදනම් ව බව ඔහු ම නොදනියි. මේ ඊනියා ප්‍රබුද්ධයන්ට ඒ සාපේකෂතාව තේරුම් ගැනීමට තරම් බුද්ධියක් ඇතැයි සිතිය නොහැකිය. පාරෙ දකුණෙන් රිය පැදවීම තහනම්ය යන නීතියවත් නිරපේකෂ වූවක් නොවෙයි. බ්‍රිතානියෙහි හා බ්‍රිතානියට යටත් ව තිබූ බොහෝ රටවල එසේ වුව යුරෝපයේ සෙසු රටවල හා ඇමරිකාවේ එසේ නොවේ. එපමණක් නොව කලින් කී රටවල එක් පැත්තකට පමණක් යා හැකි මාර්ගවල වමෙන් මෙන් ම දකුණෙන් ද රිය පැදවිය හැකිය. එලෙස නීතියෙන් මෙන්ම වෙනත් ආකාරයෙන් ද කරන තහනම් ද සාපේකෂ පමණක් නොව නිර්මාණ ද වෙයි. ඒ තහනම් මිනිසුන් විසින් නිර්මාණය කෙරී ඇත්තේ මිනිසුන්ගේම යහපත සඳහාය. මෙහිදී අවධාරණය කළ යුතු ප්‍රධාන කරුණක් වන්නේ යහපත යන්න ද සාපේකෂ බවය. ප්‍රංශයේ රිය පදවන්නේ දකුණෙන් යැයි කියමින් මෙරට ද සාමාන්‍ය මාර්ගවල දකුණෙන් රිය පැදවුවහොත් කුමක් සිදුවේ ද? නැන්දම්මා ලේලි හබය ගැන ලංකාවේ පුරුෂයන් ගැන ප්‍රංශ මහාචාර්යවරුන්ගේ විකාර මනෝවිශ්ලේෂණ හා වෙනත් කතා කියවන්නන් බටහිර රටවල ඇති නැන්දම්මා බෑනා හබය තේරුම්ගන්නේ ෆ්‍රොයිඩ් ට අනුව ද ලැකාන්ට අනුව ද? නැත්නම් පොපර්ට අනුව වුව ද විද්‍යාවක් නොවන බටහිර කසිකබල් මනෝවිශ්ලේෂණයේ කිනම් ප්‍රවාදයකට අනුව ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva